INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM

E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:

YASMIN SOOKA

**මාධ්‍ය නිවේදනය: එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකා සහභාගීත්වය අත්හිටුවයි.**

2019 සැප්තැම්බර් 27

**ජොහැන්නස්බර්ග්:** එක්සත් ජාතීන්ගේ සාම සාධක භටයන් වශයෙන් ශ්‍රී ලංකා සෙබළුන් විදේශයන්ට යැවීම අත්හිටුවීම පිළිබඳ එක්සත් ජාතීන් විසින් නිවේදනය කරනු ලැබීම රටට කණගාටුදායක දිනයකි. මේ වනාහී, සාම සාධක කාර්යයන්ට බලපානු ඇතැයි අනතුරු ඇඟවුම් තිබියදීත්, මැතිවරණ සහාය ලබාගැනීමේ අරමුණින් යුද අපරාධකරුවකු වශයෙන් චෝදනා එල්ලව ඇති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා යුද හමුදාපති ධුරයට පත් කිරීමට ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් ගන්නා ලද තීරණයෙහි ඍජු ප්‍රතිවිපාකයකි.

2008-9 වසරවල ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ අවසාන අදියරේදී ශ්‍රී ලංකා යුද හමුදාවේ 58වැනි බල සේනාවට අණ දෙන ලද්දේ ශවේන්ද්‍ර සිල්වා විසිනි. ඔහුගේ සේනාංක, වගවිභාගයකින් තොර හා චේතනාන්විතව සිවිල් ජනයාට පහර දුන් බවටත්, රෝහල් සහ වෛද්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හා යුද මුක්ත කලාපයන්ට ප්‍රහාර එල්ල කළ බව හා තහනම් අවි භාවිතා කළ බවටත් කිව හැකි සයුක්තික පදනමක් තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් අනතුරට පත් හා තුවාල ලද සිවිල් ජනගහණයට අයත් වැසියන්ගේ ප්‍රමාණය ව්‍යසනකාරී එකකි. කෙසේ වුවද, යුද්ධය නිමා වී දස වසරකින් පසු, සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ වැඩසටහනකට බැඳී සිටින අතරම, ශ්‍රී ලංකාවේ දේශපාලකයෝ, ලැජ්ජා සහගත ලෙස ශවේන්ද්‍ර සිල්වා 'යුද විරුවකු' වශයෙන් උද්දාමයෙන් පිළිගනිති. එහි ප්‍රතිඵලයක් වශයෙන්, යුද්ධයෙන් පසු හමුදාවට බැඳුණු යොවුන් සොල්දාදුවන්ට දැන් සාම සාධක රැකියා තහනම්ව තිබේ.

*"ශවේන්ද්‍ර සිල්වාගේ පත්කිරීම රටට ඛේදජනනක වූ ස්වයං හානිකර එකකි. ඒ වෙනුවට, වින්දිතයන්ට හා ඔවුන්ගේ පවුල්වලට සත්‍යය හා යුක්තිය ලබාදීම සඳහා අතීත අපරාධ පිළිබඳ අවංක වගඋත්තරදායක වීමක් ක්‍රියාවට නැංවීම පිණිසත්, සිදුකෙරෙමින් යන වදහිංසා මුලින් උපුටා දමනු වස් ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණය කිරීමක් සඳහාත් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රජාවගේ ආධාර ලබාගනු දැකීමට අපි වඩා කැමැත්තෙමු"*යි සත්‍යය හා යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපෘතියේ (ITJP) විධායක අධ්‍යක්ෂිකා යස්මින් සූකා ප්‍රකාශ කළාය.

ඉකුත් වසර ද ඇතුළත්ව, පොලිසිය සහ හමුදාවන් විසින් මෑතකාලීනව සිදුකළ වදහිංසා පිළිබඳ - 2015 සිට 79ක් - සිදුවීම් ITJP සංවිධානය විසින් ලේඛනගත කර තිබේ.

යුද්ධයේ අවසාන අදියරේදී එක් එක් ඒකකයන් හා ඔවුන්ගේ ස්ථානගතවීම් පිළිබඳ අතිශය නිරවද්‍ය ගවේෂණ සිදුකිරීම මෙන්ම තනි පුද්ගලයන් පිළිබඳ ලේඛන ගොණු සැකසීම මගින් ආරක්ෂක හා රාජ්‍ය නිලධාරීන් පිළිබඳ පූර්ව සෝදිසිකරණය සඳහා ITJP කාර්ය මණ්ඩලය වසර ගණනාවක් තිස්සේ ක්‍රියාකර තිබේ. මෙම ගවේෂණ පදනම් වූයේ දිවි බේරාගත්තවුන් හා ඇසින් දුටු සාක්ෂිකරුවන් සමග සිදුකළ සම්මුඛ සාකච්ඡාවන් හා අන්තර්ජාලයෙන් මකා දමා තිබියදී යළි සොයාගන්නා ලද යුද හමුදාවේ තත්ත්ව වාර්තා ඇතුළු විවෘත මූලාශ්‍ර තුළින් යුද්ධය සිදුකළ ආකාරය පිළිබඳව රැස්කර ගන්නා ලද දැනුම මත ය. ජාත්‍යන්තර මානුෂීය නීති උල්ලංඝණය කිරීම පිළිබඳ විශ්වාසනීය චෝදනා එල්ල වූ යම්කිසි ස්ථානයක මෙහෙයුම් සිදුකළ රෙජිමේන්තු ඒකක හඳුනාගැනීමට මෙකී කාර්යයන් මගින් අවධානය යොමුකරන ලද්දේ, එවැනි පුද්ගලයන් එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා යොදවාගැනීමේ අන්තරායය නොපිළිගත හැකි තරම් ඉහළ එකක් බවට තර්ක කරනු පිණිස ය.

*"ආරක්ෂක අංශ වගඋත්තරදායක කරනු පිණිස බොහෝ සිංහල සහ දෙමළ පිරිස් මෙකී ගවේෂණ සඳහා විචක්ෂණ ලෙස ආධාර කළ අතර ආරක්ෂක හේතු මත ඔවුන් නම් කළ නොහැකි වුව ද, අපි ඔවුන්ට ඉමහත් ලෙස කෘතවේදී වන්නෙමු"* යස්මින් සූකා කියා සිටියාය. *"එක්සත් ජාතීන්ගේ සංවිධානය ක්‍රියාමාර්ග ගන්නා බවට වූ පුවත විසින් මේ වනතුරු යුක්තියක් නොලද දෙමළ වින්දිතයන්ට දැනටමත් අපේක්ෂා ඇතිකර තිබේ."*

අත්හිටුවීමේ තීරණය පිළිබඳ දැනට දන්නා තොරතුරු විසින් පෙන්වා දෙන්නේ  මේ වනවිටත් සාම සාධක කාර්යයන්ට යොදවා ඇති ශ්‍රී ලංකා සාම සාධක හට පිරිස් ඔවුන්ගේ සංචාරය අවසාන වනතුරු රැඳී සිටින නමුත්, ඉන් අනතුරුව වෙනත් රටක සෙබළුන් ඒ සඳහා යෙදවෙන බව ය. කෙසේ වුවද, එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් බරපතල ක්‍රියාන්විත අන්තරායයන්ට නිරාවරණය වන්නේ නම්, මෙකී අත්හිටුවීමේ තීරණය අභිබවනය කළ හැකි අතුරු නියමයක් එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් එකතු කිරීමට ඉඩ ඇති බව පෙනෙන්නට තිබේ.

*"මෙහි අර්ථය කුමක්ද යන්න පිළිබඳ වඩා වැඩි නිරාකූලතාවක් එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් දැනගැනීම සඳහා අපි කටයුතු කරමු; මෙම වැදගත් මානව හිමිකම් ගැටළුව වසන්කරන්නට ප්‍රයත්න දරතොත්, සාම සාධක මෙහෙයුම් පිළිබඳ දෙපාර්තමේන්තුවේ කීර්තිනාමයට එමගින් එල්ලවන අන්තරායය අති මහත් වනු ඇත. 'ශුන්‍ය ඉවසුම් පිළිවෙතක්' ගැන ඔබ කතා කරන්නේ නම් එය ශුන්‍යයක්ම විය යුතු අතර එය ස්ථිර විශ්වාසයකින් සිදුකළ යුතු යැ"*යි සූකා මහත්මිය ප්‍රකාශ කළාය.

**සබැඳි  ITJP ප්‍රකාශන:**

- ශවේන්ද්‍ර සිල්වා විසින් මෙහෙයවන ක්‍රීඩා කටයුත්තක් සඳහා අනුග්‍රහ සැපයීම් ප්‍රශ්න කරමින්, 2017 සැප්තැම්බරයේදී ITJP සංවිධානය විසින් වෙළඳ සමාගම් දෙකක වෙත ලිපි යොමුකරන ලදී.[1]

- 2004 සිට 2007 දක්වා හයිටියේ රඳවා සිටි ශ්‍රී ලංකා සාම සාධක හටයන් විසින් සිදුකළ ළමා ලිංගික සූරාකෑම සම්බන්ධයෙන් අපරාධ වගඋත්තරදායකත්වයේ අඩුව පිළිබඳ ඒකාබද්ධ වාර්තාවක් 2017 නොවැම්බරයේ දී ITJP සංවිධානය සහ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදියෝ (JDS) සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.[2]

- ශ්‍රී ලංකාවේ අවසාන යුද්ධයේදී යුද පෙරමුණෙහි ක්‍රියාකළ නිලධාරියකුගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකා බල ඇණියක් ලෙබනනයට යැවීම සම්බන්ධයෙන් 2018 පෙබරවාරි මාසයේදී ප්‍රශ්න කර සිටි ITJP සංවිධානය, ඔහුගේ පූර්වප්‍රාප්තිකයන් තිදෙනා ද එහි යැවීමෙන් වළක්වනු නොලැබීම පිළිබඳව කණස්සල්ල පළ කර සිටියේය.

- එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්වලට සහභාගීවීමෙන් වැළැක්විය යුතු පොලිස් අතුරු හමුදා බලඇණියක් වන විශේෂ කාර්ය බලකායට අයත් 50 දෙනකුගේ රහස්‍ය නම් ලැයිස්තුවක් 2018 අප්‍රේල් මාසයේදී ITJP විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත ලබා දුන්නේ ය.[3]

---

[1] http://www.itjpsl.com/assets/press/Letter-CEAT-Specialty-Tyres-Setember-2017.pdf
http://www.itjpsl.com/assets/press/Herbert-Alan-Coca-Cola-Sept-2017.pdf
[2] A Joint Report with Journalists for Democracy in Sri Lanka: LACK OF ACCOUNTABILITY FOR CHILD SEXUAL EXPLOITATION BY SRI LANKAN PEACEKEEPERS, 13 Nov 2017,  http://www.itjpsl.com/assets/press/haiti-FINAL.pdf
[3] Press release: ITJP sends UN list of alleged perpetrators for vetting, 23 Apr 2018, http://www.itjpsl.com/assets/press/final-STF-press-release.pdf

- සාම සාධක කාර්යයන්ට අදාළ පූර්ව සෝදිසි කිරීම්වල අසමර්ථභාවය පෙන්වා දෙන රහස්‍ය ලේඛන ගොණුවක් ITJP සංවිධානය විසින් 2018 පසු භාගයේදී සාමක සාධක මෙහෙයුම් පිළිබඳ දෙපාර්තමේන්තුවට ලබාදෙන ලදී.[4] මෙම අසමර්ථවීම් අතරට, නැගෙනහිර ටිමෝරය, ඩාර්ෆූර්, දකුණු සූඩානය, ලෙබනනය, මාලි සහ හයිටි රාජ්‍යයට යොදවන ලද ශ්‍රී ලංකා භටයන් ඇතුළත් විය.

- හයිටි රාජ්‍යයේ සාම සාධන ක්‍රියා උල්ලංඝණය කිරීම ගැන වගඋත්තරදායකත්වය සම්බන්ධයෙන් රට තුළදී ඉදිරිපත් කළ තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ සිදුකළ ඉල්ලීම ගැන පූර්ණ හා සංගත ලෙස ප්‍රතිචාර දක්වන්නැයි 2018 ජූලි මාසයේදී ITJP සංවිධානය ශ්‍රී ලංකා යුද හමුදාවෙන් ඉල්ලා සිටියේය.[5]

- ITJP සංවිධානය විසින් එක්සත් ජාතීන්ට සපයන ලද විවෘත මූලාශ්‍ර තොරතුරුවල පාර්ශ්වික බලපෑම යටතේ, ශවේන්ද්‍ර සිල්වාගේ 58වැනි බලසේනාවට අනුයුක්තව ක්‍රියාකළ, මාලි රාජ්‍යයට යවන ලද හමුදා බලඇණියේ අණදෙන නිලධාරියා 2018 ඔක්තෝබරයේදී ආපසු ශ්‍රී ලංකාවට යවනු ලැබුණි.[6]

- ශ්‍රී ලංකා යුද හමුදාවේ නව මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වාගේ පත්වීම අත්හිටුවීමටත්, ඔහුට එරෙහිව යුද අපරාධ හා මානව වර්ගයාට එරෙහි අපරාධ පිළිබඳ චෝදනා ගොණුකිරීමටත් අවශ්‍ය සාක්ෂි අවශ්‍ය ප්‍රමාණයටත් වඩා ඇති බව දැක්වෙන්නා වූ, ශවේන්ද්‍ර සිල්වා පිළිබඳ මේ දක්වා නිකුත් කර ඇති ඉතා සවිස්තරාත්මක ලේඛන ගොණුව 2019 ජනවාරියේදී ITJP සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.[7]

- ශවේන්ද්‍ර සිල්වා යුද හමුදාපති ධූරයට පත්කිරීමේ තීරණයට 2019 අගෝස්තු මාසයේදී විරෝධය පළකර සිටි ITJP සංවිධානය, ජාත්‍යන්තර ප්‍රජාවෙන් සප්‍රතිපත්තික ප්‍රතිචාරයක් ඉල්ලා සිටියේය.[8]

---

[4] https://www.theguardian.com/world/2018/jul/21/sri-lanka-war-criminals-un-peacekeeping-missions-darfur-mali-south-sudan

[5] Press Statement: Haiti: More than a decade and still hiding, 17 July 2018 http://www.itjpsl.com/assets/press/Press-Statement-haiti-f.pdf

[6] http://www.itjpsl.com/assets/press/UN-repatriates-Sri-Lankan-peacekeeper-for-his-role-in-2009-war.pdf Press Release: UN repatriates Sri Lankan peacekeeper for his role in 2009 war, 20 Oct 2018

[7] http://www.itjpsl.com/assets/press/29-Jan-2019-Shavendra-Silva-press-release.pdf

[8] Press Release: Sri Lanka betrays its people by promoting alleged war criminal to head its army, 19 August 2019, http://www.itjpsl.com/assets/press/SS-Press-Release-final-2.pdf

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT